**නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන**
**----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**--------------------------------**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 18 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දිනද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ජූලි 10 දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2 මතය**
**------**

මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 අනුකූල නොවීම්**
**--------------------**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්**
**---------------------------------------------------------------------------**

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| (i) | 136 වගන්තිය | සභා සීමාව තුල පිහිටි සභාවට අයත් බදු දෙන ලද හෝ කුලියට දෙන ලද සියළු ඉඩම් හා ගොඩනැගිලිවල බදුකරුවන්ගෙන් වරිපනම් බදු හෝ අක්කර බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පනතේ අදාළ වගන්තිය පරිදි කටයුතු කල යුතුවේ. | සභාවට අයිති බදු දෙන ලද ඉඩම් හා ගොඩනැගිලිවල බදුකරුවන්ගෙන් වරිපනම් බදු අයකර නොමැති අතර දැනට දේපළ තක්සේරු ප්‍රතිශෝධනය ආරම්භ කර ඇති බැවින් ඉදිරියේදී බදු අය කිරීමට පියවර ගනිමි. |
| (ii) | 159 (1) වගන්තිය | ප්‍රාදේශීය සභාව විසින් කුලියට දී තිබෙන දේපළවලින් අයවිය යුතු කුලිය නියමිත පරිදි අයවී නොතිබෙන තත්ත්වය තුල | පනතේ අදාළ වගන්තිය පරිදි කටයුතු කල යුතු වේ. | හිඟ මුදලින් රු.128,830ක් අයකර ඇත. හිඟ මුදල් අයකිරීමට කඩ හිමියන් දැනුවත් කර ඇති අතර කඩ කාමර 03 ක් සඳහා |

| | | | |
|---|---|---|---|
| | කුලී නිවැසියන්ගේ නිශ්චල හෝ චංචල දේපළ තහනමට ගෙන විකුණා සභාවට අයවිය යුතු කුලී මුදල් හා ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | නඩු පවරා ඇත. |
| **(ආ)** <u>1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති</u> | | | |
| 65 රීතිය | ගෙවීම් සඳහා ඉඩදී තිබෙන කාල සීමාව අවසානයේදී ගෙවීම් පැහැර හරින තැනැත්තන්ගේ නාම ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ගෙවීම් පැහැර හරින්නන්ගේ නාම ලේඛනයක් පිළියෙල කර නොතිබුණු නමුත් නියමිත ගෙවීම් නොකළ අයට ලිඛිතව දැනුවත් කර ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශය අනුව 2018 දෙසැම්බර්31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.142,733,858 ක්වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.112,911,422 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම්, හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 ඇස්තමේන්තු ගත ආදායම | 2018 බිල් කළ ආදායම | 2018 රැස්කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2017 ඇස්තමේන්තු ගත ආදායම | 2017 බිල් කළ ආදායම | 2017 රැස්කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු '000. | රු. '000 | රු. '000 | රු. '000 |
| වරිපනම් හා බදු | 20,259 | 22,193 | 20,475 | 23,692 | 20,947 | 23,445 | 22,330 | 22,769 |
| කුලී | 26,303 | 29,103 | 28,425 | 2,189 | 25,115 | 26,006 | 26,062 | 1,422 |
| බලපත්‍ර ගාස්තු | 6,109 | 5,966 | 5,966 | - | 6,177 | 6,195 | 9,846 | - |
| වෙනත් ආදායම් | 266,060 | 255,617 | 236,668 | 252,866 | 209,095 | 225,037 | 226,186 | 227,368 |
| එකතුව | 318,731 | 312,879 | 291,534 | 278,747 | 261,334 | 280,683 | 284,424 | 251,559 |

- රැස් කළ ආදායම තුල සමාලෝචිත වර්ෂයට බිල් කළ ආදායමෙන් කළ එකතු කිරීම් සහ පසුගිය වර්ෂවල හිඟ ආදායමෙන් කළ එකතු කිරීම් ඇතුළත්ව තිබේ.

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස්දැක්වීම |
|---|---|---|
| ලැබිය යුතු සමස්ථ වරිපනම් හා බදු ආදායමෙන් සියයට 55 ක්ද, කුලී ආදායමෙන් සියයට 7ක්ද, වෙනත් ආදායම්වලින් සියයට 53 ක්ද, රැස් කිරීම පිළිබඳ වගකීම ඉටුකර නොතිබුණි. | නීති රීති ප්‍රකාරව ආදායම් අයකර ගත යුතු වේ. | සමාලෝචිත වර්ෂයේ සමස්ත ලැබිය යුතු වරිපනම් හා බදු, කුලී ආදායම හා වෙනත් ආදායම් ප්‍රතිශත සමග එකඟ වේ. |

### 2.2.3 වරිපනම් බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් බිල්කළ වරිපනම් බදු මුදල රු.18,690,070 න් වර්ෂය තුලදී රැස්කර ගෙන තිබුණේ රු.11,991,126 ක මුදලක් පමණි. එය බිල්කළ මුදලින් සියයට 64 ක ප්‍රමාණයක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට සභාවේ සමස්ත වරිපනම් බදු හිඟය ලේඛන | උපරිම ආදායම් රැස් කළ හැකි පරිදි කටයුතු කළ යුතු වේ. | වෙරළ ඛාදනය නිසා වරිපනම් ස්ථාන සොයාගත නොහැකිවීම හා නොදියුණු ප්‍රදේශ තක්සේරු කිරීම, වරිපනම් බල ප්‍රදේශය පුළුල්වීම නිසා වරිපනම් අයකර ගැනීමට නොහැකි විය. |

අනුව රු.23,691,610 ක් වූ බැවින් අදාල කාල වකවානුව තුලදී ආදායම් රැස් කිරීම පිළිබඳ වගකීම ඉටුකර නොතිබුණි.

**2.2.4 අක්කර බදු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ලේඛනවලට අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉඩම් හිමියන්ගෙන් රු.663,706 ක අක්කර බදු හිඟයක් වූ අතර, එම හිඟයෙන් රු.608,393 ක් අවුරුදු 05 කට වැඩි කාලයක්ද රු.54,405 ක් අවුරුදු 01 ත් 05 ත් අතර, කාලයක සිට අයවීමට තිබූ ඒවා විය. | අක්කර බදු අයකරන දේපළ පිළිබඳ සමීක්ෂණය කර අදාළ හිඟ අක්කර බදු අයකිරීමට කටයුතු කළ යුතු වේ. | ඉඩම් හිමිකරුවන්ගේ මියයාම, කොටස්වීම, දරුවන් අතර බෙදීම නිසා බොහෝ ඉඩම් හඳුනාගත නොහැකිවීම නිසා අක්කර බදු අයකර ගැනීම අපහසු වී ඇත. දේපළ පිළිබඳ සමීක්ෂණයක් කර දේපළ හඳුනාගෙන ලේඛන යාවත්කාලීන කිරීම හා ඉදිරි පියවර ගැනීමට කටයුතු කරමි. |

**2.2.5 බදු කුලී හා කඩ කුලී**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ලේඛනවලට අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ කඩ කුලී හා බදුකුලී රු.2,188,982 ක් විය. එයින් වර්ෂ 05 කට වැඩි කඩ කුලී හා බදු කුලී රු.216,761 ක්ද, වර්ෂ 01 – 05 අතර වටිනාකම රු.527,026 ක්ද විය. | අයවිය යුතු හිඟ කඩ කුලී හා බදු කුලී අය කිරීමට කඩිනම් පියවර ගත යුතු වේ. | මෙම හිඟ මුදලින් රු.289,945 ක් 2019 අප්‍රේල් වන විට අයවී ඇත. ඉතිරි මුදල් අය කිරීමට හා නඩු පැවරීමට කටයුතු කර ඇත. |

**2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් නිලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.46,365,631 ක් හා මුද්දර ගාස්තු රු.191,991,322 ක් විය. | අයවිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු හඳුනාගෙන කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ප්‍රධාන ලේකම් වෙත ඉල්ලීම් ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

## 3 . මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 03 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය පහසුව හා සුභ සාධන යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ පනත මඟින් ප්‍රකාශිත (සම්මත අතුරු ව්‍යවස්ථා) අතුරු ව්‍යවස්ථා 42 ක්ද, නව අතුරු ව්‍යවස්ථා 07 ක්ද, සභාව වැළඳ ගෙන තිබුණි. | සභාවට අවශ්‍ය අතුරු ව්‍යවස්ථා කඩිනමින් වැළඳ ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරිපත් කර ඇති කරුණු හා එකඟ වේ. |

#### (ආ) ක්‍රියාකාරී සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | භෞතික සේවා<br>සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක කිරීමට සැළසුම් කර තිබුණු ඇස්තමේන්තු මුදල රු.19,726,195 ක් වූ මාර්ග සංවර්ධන හා ඉදිකිරීම් කටයුතු වර්ෂය තුල ක්‍රියාත්මක කොට නොතිබුණි. | සැලසුම් සකස් කර ඉදිකිරීම් කඩිනම් කිරීමට කටයුතු කළ යුතු වේ. | 2018 වැය ශීර්ෂ මගින් ප්‍රතිපාදන වෙන්කරගෙන සැලසුම් සකස් කළ අතර ඒවා නිම කරමින් පවතී. |
| (ii) | ජල හා සනීපාරක්ෂක සේවා<br>වර්ෂය සඳහා සකස් කර තිබූ ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් රු.3,350,000 ක් වූ ව්‍යාපෘති 05 ක් වර්ෂය තුල ක්‍රියාත්මක කොට නොතිබුණි. | සැලසුම් කළ ව්‍යාපෘති අවසන් කළ යුතු වේ. | වැඩසටහන් 02 ක් සඳහා ඉල්ලීම් ඉදිරිපත් නොවූ අතර එක් වැඩසටහනක් නිමකර ඇත. බාහිර කරුණු නිසා වැඩසටහන් 02 ක් ප්‍රතික්ෂේප වී ඇත. |

| | | |
|---|---|---|
| (iii) <u>ප්‍රජා සංවර්ධන පරිසර ක්‍රියාකාරකම්</u><br>ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් රු.1,180,000 ක් වූ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති 04 ක් වර්ෂය තුල ක්‍රියාත්මක කොට නොතිබුණි. | සැලසුම් කළ ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු වේ. | එක් වැඩසටහනක් නිමකර ඇති අතර වැඩසටහන් 03 ක් සඳහා ප්‍රතිපාදන අවශ්‍ය නොවුණි. |

**(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

**--------------------------------**

| <u>**විගණන නිරීක්ෂණය**</u> | <u>**නිර්දේශය**</u> | <u>**ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම**</u> |
|---|---|---|
| සභා බල ප්‍රදේශය තුල දිනකට කසළ ටොන් 08 ත් 10 ත් අතර, ප්‍රමාණයක් එකතුවන අතර, මේවායෙන් වැඩි ප්‍රමාණයක් වෙන් කර ලබා ගැනීමක් සිදුවේ. දිනකට එකතුවන මුළු කසළ ප්‍රමාණයම කොම්පෝස්ට් ක්‍රියාවලියට යොදාගෙන තිබුණි. කොම්පෝස්ට් අංගනයේ ගොඩනැගිලි ඉදිකිරීමට 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා පළාත් සභා අරමුදල් වලින් රු.1,656,754 ක් හා ප්‍රාදේශීය සභා අරමුදලින් රු.5,430,725 ක් වැය කර තිබූ අතර බොබ් කැට් යන්ත්‍රයක් ආධාර වශයෙන් ලැබී තිබුණි. | කසළ ප්‍රතිචක්‍රීකරණ වැඩ පිළිවෙල තවදුරටත් කාර්යක්ෂම කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරිපත් කළ කරුණු හා එකඟ වේ. |

**(ඈ) තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක**

**-----------------------------------------**

| <u>**විගණන නිරීක්ෂණය**</u> | <u>**නිර්දේශය**</u> | <u>**ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම**</u> |
|---|---|---|
| 2019 සිට 2030 අතර කාලය තුලදී තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමේ මූලික පියවරයන් සභාව විසින් ආරම්භ කර තිබුණු අතර, එහිදී දිළිඳු බව තුරන් කිරීම, පානීය ජල අවශ්‍යතාවය සපුරාලීම, සෞඛ්‍ය සම්පන්න ජීවිත සුරක්ෂිත කිරීම සහ සෑම වයස් තත්ත්වයක් සඳහාම ශරීර සුවතාව වර්ධනය කිරීම යටතේ | තිරසර සංවර්ධන අරමුණු හඳුනාගෙන එය ඉටුකිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරිපත් කළ කරුණු හා එකඟ වේ. |

සෞඛ්‍ය හා සනීපාරක්ෂාව සලසාදීම, පරිපූර්ණ සහ සාධාරණ අධ්‍යාපනයක් සුරක්ෂිත කිරීම සහ සැමට ජීවිත කාලය පුරා අධ්‍යාපන අවස්ථා ප්‍රවර්ධනය කිරීම යටතේ දිළිඳු දරුවන්ගේ අධ්‍යාපන අවශ්‍යතා සඳහා සහායවීම හා නම්‍යශීලී යටිතල පහසුකම් සංවර්ධනය තිරසර හා පරිපූර්ණ කාර්මිකකරණය හා නවෝත්පාදනය දිරිමත් කිරීම කෙරෙහි අවධානය යොමුකර තිබුණි.

## 3.2 මානව සම්පත් කළමනාකරණය

### (අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අනුමත කාර්ය මණ්ඩලය වූ 218 ඉක්මවා 238 ක් සේවයේ යෙදවීම හේතුවෙන් 10 ක සේවක අතිරික්තයක් හා පුරප්පාඩු 27 ක් පැවතුණි. | පුරප්පාඩු තනතුරු පිරවීමට සහ අතිරික්ත තනතුරු සඳහා අනුමැතිය ලබාගැනීමට කටයුතු කළ යුතු වේ. | සේවා ගිවිසුම් හා ආදේශක පදනම මත බඳවා ගැනීමෙදී පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය අනුව සිදුකර ඇත. අතිරික්ත තනතුරු 10 ක් අනුමැතිය සඳහා යවා ඇත. |

### (ආ) සේවක ණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පසුගිය වර්ෂවලදී ස්ථාන මාරු වී ගිය හා සේවය හැර ගිය සේවකයින් 34 දෙනෙකුගෙන් රු.389,140 ක ශේෂයක් අයවිය යුතුව තිබුණි. | අයවිය යුතු සේවක ණය කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ස්ථාන මාරු වී ගොස් සිටින සේවකයින් 04 දෙනෙකුගෙන් අයවිය යුතු රු.168,160 ක්ද, සේවය හැර ගිය පුද්ගලයින් 07 දෙනෙකුගෙන් අයවිය යුතු මුදල රු.120,416 ක්ද වේ. දෛනික සේවයේ සිට සේවය හැර ගිය අයගෙන් අය විය යුතු මුදල රු.100,563 කි. සහා අනුමැතිය මත කපා හැරීමට පළාත් පාලන කොමසාරිස් වෙත යවා ඇත. |

**3.3 මෙහෙයුම් ආකාර්යක්ෂමතා**

**(අ) ඉඩම් කට්ටිකර විකිණීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අක්කර 11, රූඩ් 03, පර්චස් 4.61 ක් විශාල වීරහේන පිහිටි හොරගහවත්ත නැමති ඉඩම 2017 නොවැම්බර් 08 දින ඉඩම් කට්ටි කර විකිණීමට අනුමැතිය ලබාදී තිබුණු නමුත් කට්ටි සැලැස්මට අනුව රූඩ් 03, පර්චස් 32.34 ක් වූ පොදු පහසුකම් සඳහා වෙන්කර තිබූ ඉඩම් කොටස හා 2016 ඔක්තෝබර් 10 දින අනුමැතිය ලබාදී තිබුණු මිල්ලගහවත්ත නැමති ඉඩමෙන් පොදු පහසුකම් සඳහා වෙන්කර තිබුණු පර්චස් 28.6 ක ඉඩම් කොටස ඔප්පුවකින් ප්‍රාදේශීය සභාවට පවරාගෙන නොතිබුණි. | කඩිනමින් අදාල ඔප්පු ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ප්‍රාදේශීය සභාවේ පොදු ඉඩම් කොටසේ ඔප්පුව ලබා දීමට කටයුතු කරන ලෙස දන්වමින් ලිපි යැවූ නමුත් මේ වන තෙක් ඔප්පුව සභාවට ඉදිරිපත් කර නොමැත. |

**(ආ) තල්විල ජල ව්‍යාපෘතිය සඳහා නව ගැඹුරු නල ළිඳක් ඉදිකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තල්විල පානීය ජල ව්‍යාපෘතිය සඳහා 2015 වර්ෂයේ නල ළිඳක් සකස් කර තිබූ අතර, 2019 ජනවාරි මස වන විට මෙම ව්‍යාපෘතිය සඳහා රු.972,5 33 ක වියදමක් සිදුකර තිබුණද, විදුලි මෝටරයක් සහ ජල සැපයුම් මාර්ගය ඉදි නොකිරීම නිසා නල ළිඳ හා මෝටර් කුටිය අවුරුදු 03 කට අධික කාලයක් නිශ්ක්‍රීයව තිබුණි. | අදාල කාර්යයන් කඩිනමින් සිදු කර පාරිභෝගිකයාට ජලය ගැනීමට අවස්ථාව සැකසිය යුතු වේ. | නළ ළිඳට විදුලි මෝටරය හා අනෙකුත් විද්‍යුත් උපාංග සවි කිරීම සඳහා මිල ගණන් කැඳවා කමිටු අනුමැතිය ලබාගෙන ඇත. එකී වැඩ කොටස් 2019 ජුනි මස අවසන් කිරීමට අපේක්ෂා කරන බව දන්වමි. |

## 4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වර්ෂය තුල වැය විෂයයන් 28 ක සේවා සැපයීමට වෙන්කර තිබූ රු.91,418,960 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | තාත්විකව අයවැය ලේඛන සකස් කිරීමට පියවර ගත යුතු වේ. | අයවැය විෂයයන් 28 ක සේවා සැපයීමට වෙන්කර තිබූ රු.91,418,960 ක ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව පිළිගනිමි. |

### 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මූල්‍ය සහ මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබූ අතර අභ්‍යන්තර විගණන වාර්තාද ඉදිරිපත් කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන වාර්තා විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වේ. | මේ සභාවේ අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා ඇති අතර අභ්‍යන්තර විගණන සැලැස්මක්ද සකස් කරමින් පවතී. එම නිලධාරින් වෙත වරින් වර අභ්‍යන්තර විගණනය සිදු කොට වාර්තා ඉදිරිපත් කරන ලෙස දැනුම් දී ඇත. |